## 464 පොට්ටු පොට්ටු

පොට්ටු පොට්ටු මල් පොහොට්ටු
පෙත්ත පෙත්ත විකසිත වී
මල් ලෝකෙට පිවිසෙනවා //
කැදැල්ලේ උන් කුරුළු පැටව්
මව්පියෝ හැර දෙපත් සලා
අහසට ඉගිලී යනවෝ යනවෝ//

තනිව හැංගි තිබුණ පොට්ටු මල් ලෝකෙට පිවිසීලා
බඹරු ඇදෙයි හැම අතින්ම සුවඳ බෙදන විට ලෝකෙට
මලක දිවිය ඇරඹීලා පලබර ලෝකෙට බෙදන්න

ජීවිතයේ පොට්ටු වයස මල් ලෝකෙට පිවිසෙනවා
දෙවිඳු පෙමට මිනිස් පෙමට ඒ ජීවිත කැපවෙනවා
දෙව් ප්‍රේමය ලොව බෙදන්න දෙවිඳුන් ඔබ සුරකීවා

කූඩුවේ සිටි කුරුළු පැටව් ඈතට ඉගිලී යනවා
හිස්ව තිබුණ ආකාසෙට තරු මල් ඉහලා වාගේ
නව ජීවය කුරුල්ලන්ට ලෝකෙට ලස්සන ගෙනෙන්න

ජීවිතයේ කැකුළු වයස කුරුළු ලොවට පිවිසෙනවා
නිදහස අයිතිය ප්‍රේමය සතුටින් දෙවිඳුට පිදෙනවා
දෙව් ප්‍රේමය ලොව බෙදන්න දෙවිඳුන් ඔබ සුරකීවා